ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති සංස්කාරක 2021 ජූලි 22

# ප්‍රවෘත්ති නිවේදනය

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2021 ජූනි**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය**

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2021 ජූනි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 6.1%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය මැයි මාසයේද ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 6.1%ක් ලෙස වාර්තා විය. 2021 ජූනි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 4.5%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.6%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2020 ජූනි මාසයේ 6.3%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 5.8%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 0.5%ක් විය. 2020 ජූනි මාසයට සාපේක්ෂව 2021 ජූනි මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සහල්, පොල්, පොල්තෙල්, එළවළු, කහ කුඩු සහ ලොකු ළූණු යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2021 මැයි මාසයේ 143.6ක් වූ දර්ශකාංකය 2021 ජූනි මාසයේ 145.7ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2021 ජූනි මාසයේ දර්ශකාංකය 2.1ක වැඩිවීමක් එනම් 1.5ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 1.23%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.22%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට සහල්, එළවළු, පොල්තෙල්, අළුත් මාළු, කරවල, මයිසූර් පරිප්පු, අර්තාපල්, ලොකු ළූණු, රතු ළූණු, සීනි, දෙහි, සුදුළූණු, බිත්තර, අමු මිරිස්, කුකුල් මස්, මිරිස් කුඩු, මුං ඇට, කහ කුඩු සහ කඩල යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා විය. කෙසේ වෙතත් පළතුරු සහ පොල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2021 ජූනි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'ප්‍රවාහන' *(පෙට්‍රල් සහ ඩීසල්)*, 'සෞඛ්‍ය' *(ඖෂධ නිෂ්පාදන මිලදී ගැනීම)* සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(භූමිතෙල්)* යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. තවද 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ සුළු මිල වැඩිවීමක් වාර්තා වී ඇත. පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' කාණ්ඩයේ සුළු මිල අඩුවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් 'රෙදිපිළි හා පාවහන්', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන', 'ආපනශාලා සහ හෝටල්' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2021 මැයි මාසයේ 4.2% සිට 2021 ජූනි මාසයේ 4.1% දක්වා අඩුවීමක් වාර්තා විය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| 2020 | ජුනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 |
| | අගෝ. | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 |
| | සැප්. | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 |
| | ඔක්. | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 |
| | නොවැ. | 139.8 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 4.5 |
| | දෙසැ. | 141.2 | 140.5 | 1.0 | -0.1 | 4.6 | 4.7 |
| 2021 | ජන. | 142.1 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 4.2 |
| | පෙබ. | 142.8 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 4.1 |
| | මාර්තු | 142.1 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 4.1 |
| | මැයි | 143.6 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 4.2 |
| | ජුනි | 145.7 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 4.1 |